41

# ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය ලබන සිසුන්ගේ භූගෝලවිද්‍යා සංකල්ප සාධනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

1983 අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධනයයි.


ඩී.වී.බී. චන්ද්‍රලතා.
(බී.ඒ. අධ්‍යාපන ඩිප්ලෝමා සම්මාන)
අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්වවිද්‍යාලය.


1984..08..07....


UCLIB
389913

# සංක්ෂේපය.

උක්ත අධ්‍යයනය පිළිබඳ ගැටළුවත් පර්යේෂණ සිදුකළ ආකාරයත් එහි නිගමනත් සංක්ෂේපයෙන් දැක්වීම සඳහා මෙම පිටු කිහිපය මිඩංගු කෙරේ. වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත් ප්‍රශ්නයක් බවට පත්ව ඇති ජ්‍යෙෂ්ඨ ද්විතීයික සිසුන්ගේ සාධන දුර්වල්තා පිළිබඳව විමර්ශනයක යෙදීම කාලෝචිත බව පෙනේ. සිසුන්ගේ විභාග ප්‍රතිඵල දුර්වල වීම මෙන්ම මෙම ප්‍රතිඵල වල ප්‍රාදේශීය වෙනස්කම් ද බොහෝ අංශ වල විවේචනයට තුඩු දී ඇත. විශ්ව විද්‍යාලවලට සිසුන් තේරීමේ ක්‍රමය පිළිබඳව ද බොහෝ දෙනාගේ විමසුම් ඇස යොමු වී ඇත. පර්යේෂිකාව විසින් දිවයිනේ ප්‍රදේශ කිහිපයක උසස් පෙළ පන්තිවල භූගෝල විද්‍යාව උගන්වා ලද අත්දැකීම් හා පෙළඹවීම ඔස්සේ මෙම අධ්‍යයනය දියත් කිරීමට අදහස් කළේ මෙම තත්ත්වයන් පිළිබඳව විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් බලා කිසියම් නිගමන වලට එළඹ එම තත්ත්වයන්ට යෙදිය යුතු පිළියම් කිහිපයක් එළිදැක්වීම අරමුණු කරගෙනය.

පළමුවන පරිච්ඡේදයෙන් අධ්‍යයනය හා රට පසුබිම් වූ හේතු හැඳින් වේ. ජ්‍යෙෂ්ඨ ද්විතීයික පන්තිවල භූගෝලවිද්‍යා විෂයය පිළිබඳව දිවයිනේ පාසැල් වර්ග තුනකින් තෝරාගත් නියැදියක ඉගැන්වීම් තත්ත්වය, ගුරු ආකල්ප, සම්පත් ව්‍යාප්තය සහ ගැහැණු පිරිමි බව අනුව සාධන තත්ත්වයන් වෙනස් වන්නේ කෙසේද යන්න විමසා බැලීම සඳහා තෝරාගන්නා ලද අරමුණු 4 ත් එම අරමුණු පරීක්ෂා කිරීම සඳහා පර්යේෂිකාව දියත් කළ පර්යේෂණ මාර්ගයන් එම පරිච්ඡේදයේ අඩංගුය. සිසුන්ගේ සංකල්ප සාධනය කෙරෙහි බුද්ධිය, සමාජ ආර්ථික තත්ත්වයන්, පෙළඹවීම, පාසැල් පරිසරය, බාහිර ඉගැන්වීම්, ගුරුවරුන්ගේ ඇප කැපවීම ආදී හේතු රැසක් බලපායි. මේ සියල්ලෙහි බලපෑම එකම පර්යේෂණයකින් සොයා බැලීම දුෂ්කරය. එබැවින් මෙම පර්යේෂණයේ දී පහත සඳහන් අභ්‍යුපන්‍යාස 4 ත් පමණක් පිරික්සීමට අරමුණු කරගන්නා ලදී.

1. පාසැල් වර්ග වශයෙන් ගෙන බලන කළ ජ්‍යෙෂ්ඨ ද්විතීයික සිසුන්ගේ භූගෝල විද්‍යා සංකල්ප සාධනයෙහි කැපී පෙනෙන වෙනසක් නැත.

2. අධ්‍යාපන දිස්ත්‍රික්ක වශයෙන් සහ නාගරික අර්ධනාගරික හා ග්‍රාමීය වශයෙන් බලන කළ ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණි වල සිසුන්ගේ භූගෝල-විද්‍යා සංකල්ප සාධනයෙහි කැපී පෙනෙන වෙනසක් නැත.

3. පිරිමි සහ ගැහැණු වශයෙන් සලකා බලන කළ ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන්ගේ භූගෝලවිද්‍යා සංකල්ප සාධනයෙහි කැපී පෙනෙන වෙනසක් නැත.

4. සමාජ ආර්ථික තත්ත්වයන්ගේ වෙනස්කම් මත ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණි වල සිසුන්ගේ සංකල්ප සාධනයෙහි කැපී පෙනෙන වෙනසක් නැත.

මෙම අභ්‍යුපන්‍යාසයන් සංඛ්‍යා විද්‍යාත්මකව සොයා බලා නිගමන වලට බැසීම හා එම නිගමන අනුව සාධක විෂමතා වලට පිළියම් යෙදීම මෙම අධ්‍යයනයේ පරමාර්ථය වේ.

වර්තමානයේ පිළිගත් අධ්‍යාපන පරමාර්ථයන් මොනවාද, ඒවා ඉටුකර ගැනීමේදී සංකල්ප වල වැදගත්කම කෙබඳුද, සංකල්ප ඉගැන්වීමේ දී හා අධ්‍යාපන පරමාර්ථ ඉටුකරගැනීමේ දී භූගෝලවිද්‍යා විෂයයට ලැබෙන ස්ථානය කුමක්ද යන්න පිළිබඳව දෙවැනි පරිච්ඡේදයෙන් විග්‍රහ කිරීමට යත්න දරන ලදී. විශේෂයෙන්ම දැනුම ලබාදීමේ දී වර්තමානයට අවශ්‍ය දැනුම් සම්භාරය ඉතා පුලුල් හෙයින් සංකල්ප හා සංකල්පන මාලාවන් මගින් එය කෙටි කිරීමට හා වර්ග කිරීමට හා තහවුරු කිරීමට ලැබෙන පිටුබලය මෙහිදී සාකච්ඡාවට බඳුන් විය. විශේෂයෙන් මෙහිදී භූගෝලවිද්‍යාවේ සමෝධානික ස්වරූපයත් එය ශිෂ්‍යයාගේ දැනුම ආකල්ප හා කුසලතා වර්ධනයට ඉටුකරන මෙහෙයත් මෙහිදී සාකච්ඡා විය.

අද්‍යතන අධ්‍යයනයට අදාල කරගන්නා ලද පූර්ව පර්යේෂණ පිළිබඳව තුන්වන පරිච්ඡේදයෙන් දැක්විණි. මෙහිදී එම පර්යේෂණ තොරතුරු වර්තමාන අධ්‍යයනයට අදාළ කරගත් ආකාරය පැහැදිලි කරන ලදී. විෂයමාලාවන්, විෂය සාධන තත්ත්වයත්, විෂය සාධනය මැනීම පිළිබඳ පර්යේෂණයන් හා විෂය සාධනය මැනීමේ ශිල්ප ක්‍රම පිළිබඳ පර්යේෂණයන් පිළිබඳ තොරතුරු කෙබඳුද,/එම පර්යේෂණ ක්‍රම හා පර්යේෂණ නිගමනයන්

ඇසුරින් වර්තමාන අධ්‍යයනයට ලැබුණු එළිය කෙබඳු වීද යන කරුණු මෙම පරිච්ඡේද-යේදී සාකච්ඡා විය.

වර්තමාන අධ්‍යයනයේ පස්වන පරිච්ඡේදයෙන් දත්ත විශ්ලේෂණය පිළිබඳව විස්තර වේ. මෙම දත්තයන් සංඛ්‍යාත්මකව විග්‍රහ කිරීමේදී පෙනී ගියේ අභ්‍යුපගමයයන් සියල්ලම ප්‍රතික්ෂේප වුණු බවය. C, ශ්‍රේණියේ පාසැල් පමණක් ගෙන සලකා බැලීමේදී හා මාතර තංගල්ල පාසැල් පමණක් ගෙන වෙනම පරීක්‍ෂා කර බැලීමේදී පමණක් වෙනසක් ගැන අභ්‍යුපගමයය පිළිගැනීමට සිදුවූ බව මෙම පොදු දත්ත විග්‍රහයට අමතරව පෙන්වා දිය යුතුය.

දත්ත අර්ථ කථනය සඳහා වෙන්වුණු හයවන පරිච්ඡේදයේදී ප්‍රශ්නාවලියෙන් ලබාගන්නා ලද තොරතුරු අනුව මෙම සාධන වෙනස්කම් වලට තුඩුදුන් හේතු පරීක්‍ෂා කරන ලදී. සමාජ ආර්ථික කරුණු - ග්‍රාමීය නාගරික බව ලිංගික වෙනස පාසැල්වල වෙනස, සාධනය කෙරෙහි බලපාන්නේ කෙසේද කොතෙක් දුරට ද එයට හේතු මොනවාද, යන්න මෙහිදී බොහෝදුරට පෙන්වා දීමට උත්සාහ දරන ලදී.

පර්යේෂිකාවගේ අවසාන නිගමන හා යෝජනා හත්වන පරිච්ඡේදයෙන් එළි-දැක්වේ. සාධන විෂමතා සමනය කොට එම සාධන මට්ටම තවදුරටත් වර්ධනය කිරීමට අවශ්‍යවූත් දිවයිනේ සමාජ ආර්ථික තත්ත්වයන්ට ඔරොත්තු දෙන්නාවූත් යෝජනා ඉදිරිපත් කිරීමට මෙහිදී විශේෂයෙන් සැලකිලිමත් වූ බව කිව යුතුය.

--------